# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## බෞද්ධ ශිෂ්ටාචාරය - 13 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

**තිළිණ ජයවර්ධන** - ර/මල්වල මහා විද්‍යාලය

### 6 වන සතිය

**01.** චතුර් වර්ණයට නියමිත කාර්යය පැවරිමක් කළ ස්වධර්ම යටතේ බ්‍රාහ්මණ වංශිකයන්ට වරප්‍රසාදයක් හිමිකර තිබුනේ වුවද ශුද්‍රයන් හැර ඉතිරි වර්ණ තුනට පොදු කාර්යයන් දෙකක්ම දැක ගත හැකි විම

**(1)** යාග කරවිම හා වෙළඳම
**(2)** කෘෂි කර්මය හා යාග කිරිම
**(3)** යාග කිරිම හා ඉගෙනීම
**(4)** ඉගෙනීම හා යාග කරවිම
**(5)** දන්දීම හා යාග කරවිම (...)

**02.** යාග කිරිම හා කරවිම බ්‍රාහ්මණ වර්ණය සතු ප්‍රධාන කාර්යයන් වේ. යාග කිරීම සඳහා කැපවූ පූජකයෝ කොටස් 04 කි. මේ අතරින් දෙවියන්ට යාගය සඳහා ආරාධනා කරන්නා හඳුන්වන්නේ

**(1)** හෝතෘ නමින් **(2)** යාග කාරක නමින්
**(3)** උද්සාතෘ නමින් **(4)** යාඥකාරක නමින්
**(5)** අධ්වර්යුයු නමින් (...)

**03.** සාරධර්ම මඟින් පැහැදිලි වන්නේ වර්ණ ධර්ම හතරට පැවරි ඇති කාර්යයන් "කාමයේ නොඇලීම" සාරධර්මයක් වන්නේ

**(1)** පූජකයන්ට **(2)** බ්‍රාහ්මණයන්ට
**(3)** වෛශ්‍යයනට **(4)** ක්ෂත්‍රයන්ට
**(5)** ශුද්‍රයන්ට (...)

**04.** බුද්ධ කාලීන භාරතිය ආගමික නායකයන් අතර ෂට් ශාස්තෘවරු කැපී පෙනෙන පිරිසක් ලෙස හඳුනාගත හැකිය ඔවුන්ගේ ඇතමෙක් ආගමික විප්ලවයකට පෙන්විමට ක්‍රියා කළ අතර අලසකමට මිනිසුන් යොමු කරපු අයද මෙවුන් අතර වුහ නාස්ති වාදි මිනිසා තවත් සමරකුගේ ජනප්‍රිය ඉගැන්විම වීය අන්තගාමීව සැප විඳිමත් අන්තගාමීව දුක් විඳිමත් තවත් සමහරකුගේ ප්‍රතිපත්ති විය ඔවුන් අතර උච්ඡේදවාදි භෞතික චින්තනයන් ඉගැන්වූ ශාස්තෘවරයා වුයේ

**(1)** පූර්ණ කස්සප **(2)** සංජය බෙල්ලට්ඨිපුත්ත
**(3)** අජිත කේසකම්බල **(4)** මක්කලි ගෝසාල
**(5)** පකුධ කච්චායන (...)

**05.** දිඝ නිකායේ අග්ඤඤ්ඤ සූත්‍රයට අනුව සමාජ විකාශනයේ ප්‍රතිපලයක් වශයෙන් චතුර් වර්ණ බිහිවිය ඒ අනුව "ඛෙත්තනං අධිපති බො වාසෙට්ඨෙ ඛත්තියෙ " යනුවෙන් දක්වා ඇත්තේ

**(1)** බ්‍රාහ්මණයන්ට **(2)** ක්ෂත්‍රයන්ට
**(3)** වෛශ්‍යයනට **(4)** ශුද්‍රයන්ට
**(5)** ෂට් ශාස්තෘවරු (...)

**06.** බ්‍රාහ්මණ සංස්කෘතිය බුද්ධ කාලීන කාන්තාවන්ගේ සමාජිය ආර්ථික දේශපාලනික ආගමික සාහිත්‍යයෙන්ද බෞද්ධ මුලාශවලින්ද පැහැදිලි වේ එහෙත් අධ්‍යාත්මික විමුත්තිය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නෙවන බව බුදු සමය මඟින් අවධාරණය කරයි

**(1)** මවක් වශයෙන් වන්දනිය තත්වයක් කාන්තාවන්ට හිමිකර දිමෙන්
**(2)** ථෙරි ගාථාවල දැක්වෙන භික්ෂුණින්ගේ ප්‍රකාශ මඟිනි
**(3)** බිරිඳක් වශයෙන් කාන්තාවකගේ අයිතිවාසිකම් තහවුරු කරදිම
**(4)** බිරිද සාමියාගේ හොඳම මිතුරිය ලෙස හඳුන්වා දිම
**(5)** කාන්තාවන් ඒ ඒ හවෙදි විචක්ෂණශලිව ක්‍රියා කරන බව (...)

**07.** "යථා ඒතාසු ජනිසු ලිංග කතිමයං පුථු
ඕවං නත්ථි මනුස්සේසු
ලිංග ජතිමයං පුථු" යනුවෙන් දේශනා කරජින් ජිනිසුන් එකම ජාතියක් බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ

**(1)** ජීව විද්‍යාත්මක කාර්යය පදනම් කරගෙනය
**(2)** ආචාර විද්‍යාත්මක කාර්යය පදනම් කරගෙනය
**(3)** ඓතිහාසික කාර්යය පදනම් කරගෙනය
**(4)** සමාජ විද්‍යාත්මක කාර්යය පදනම් කරගෙනය
**(5)** මේ සියල්ලම පදනම් කරගෙනය (...)

**08.** තිර්ථක යාගය වෙනුවෙන් මිල මුදල් ධාන්‍ය වර්ග වියදම් කරනවාට වඩා තමා උපයාගත් වස්තුව පංච බලි වෙනුවෙන් පරිත්‍යාග කිරිමෙන් මෙලෙව ජීවිතය සාර්ථක කර ගැනිමට හැකි බව බුදුන් වහන්සේ වදාලහ. ඒ අනුව ආගන්තුක සත්කාරය සඳහා බුදුන් වහන්සේ හඳුන්වා දුන්නේය

**(1)** රජ බලි **(2)** ඥාති බලි **(3)** අතිථි බලි
**(4)** දේවතා බලි **(5)** පුබ්බපේත බලි (....)

**09.** බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට අනුව ස්වාමි පුර්ෂයා මිය ගිය පසු වැන්දඹු කාන්තාව විසින් ඉටු කළ යුතු උසස්ම පරිත්‍යාගය ලෙස සලකන ලද්දේ

**(1)** වැඩිමල් පුතු යටතේ ජිවත් විම
**(2)** දිවි ඇතිතාක් අවිවාහකව සිටිමින් ස්වාමි පුර්ෂයාගේ ඥාති කුළ වලට දාසියක් ලෙස සේවය කිරිම
**(3)** ස්වාමියාගේ මළ සිරුර දැවෙන සෑයට පැන ජිවිතය පුජා කිරිම
**(4)** තමන් සතු වස්තුව වැය කොට ස්වාමියා වෙනුවෙන් යාග හෝම පැවැත්විම
**(5)** විනෝදාත්මක ජිවිතයෙන් බැහැර විම (....)

**10.** බුද්ධ කාලීන භාරතයේ පැවති සොළොස් මහා ජනපද අතර ගණත්ත්‍රයන් පාලනය ක්‍රියාත්මක වු ජනපද දෙකක් ලෙස හඳුනාගත හැකි වන්නේ

**(1)** වජ්ජි හා මගධ **(2)** වජ්ජි හා කෝසල
**(3)** වජ්ජි හා කාසි **(4)** වජ්ජි හා අවන්ති
**(5)** වජ්ජි හා මල්ල (....)